

# ඌවේ සුන්දර ගිරිසිරස නමුණුකුළ

**යූ.පී.එස්.පතිරණ**


**සොබාදහමේ අපූර්ව දයාදයන් රැසකට උරුමකම් කියන ඌව පළාතේ පිහිටි වඩාත් සුන්දර දයාදය කුමක්දැයි නිගමනය කිරීමේදී නමුණුකුළ ගිරි සිරස නිතැතින්ම සිතට නැගෙන්නේ ගීත රචකයකු විසින් විචිත්‍රව රචිත "තුමුල නමුණුකුළ ගිරි හිස, උදුල සඳ මඬල දුටු නෙත රැවටුනා තමයි..." යන ළයාන්විත ගීතය ද සිහිපත් කරමිනි.**


ඌව පළාතේ පාරිසරික තුල්‍ය-තාව උදෙසා අතිශයින් වැදගත් කඳුකර වනාන්තරයක් වූ නමුණු-කුල කඳුවැටිය, පස්සර, බදුල්ල හා ඇල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයන් මායිම්ව පිහිටා තිබේ. බදුල්ල නගරයේ සිට කිලෝමීටර් පහක් පමණ ස්ප්‍රිංවැලි මාර්ගය ඔස්සේ ද, පස්සර මාර්ගය ඔස්සේ ද සුන්දර නමුණුකුළ වෙත ළඟා විය හැකි ය. අලංකාර තේ වතු වලින් වටකරගත් පරිසරයක, කෙලවර තුරු වනපෙතින් වැසුනු නමුණුකුළ ගිරි සිරස නෙත ගැටෙන්නේ අමුතු චමත්කාරයන් සිත තුළට කිඳ බසිමිනි.

උසින් අඩි 6671 ක් පමණ වන නමුණුකුළ ශ්‍රී ලංකාවේ උසින් සිව්වන ස්ථානය ගනු ලබන උස් කඳුවැටිය ලෙසද සැලකේ. විශා-ලත්වයෙන් අක්කර 614 කට මඳක් වැඩි නමුණුකුළ පරිසරය රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති වන රක්ෂිතයකි.

විනෝදකාමීන් තෙහෙට්ටුව නොබලා තරණය කරනු දැකිය හැකි වුවද, නමුණුකුළ කඳුවැටිය පිළිබඳව බොහෝවිට ප්‍රදේශයේ වැඩිහිටි ජනතාව තුළ පිළිසිඳ ඇත්තේ, යම් ආකාරයක භක්ති-යක් දෙන ආකාරයේ ගුප්ත විශ්-වාසයන් යැයි කිවහොත් නිවැරදි ය. විශේෂයෙන් ඌව පළාතට තිසි වර්ෂාව නොමැතිව ඉඩෝරයෙන් පෙළෙන කාල වලදී මුනියංගනයේ හාමුදුරුවන්ට පෙතිකඩ පූජාව කරමු යැයි ආරාධනය කර පෙති-කඩ සමග බදුල්ලේ කතරගම දේවාලයේ දේව ආභරණ සහ පත්තිනි දේවාලයේ සළඹත් රැගෙන පෙරහැරින් නමුණුකුළ වෙත ගොස් ඉන්දික දෙවියන්ට දානය පිළිගන්වන්නේ එහෙයිනි. ඒ නිසා, නොවැරදීම වර්ෂාව ලැබෙන නිසාම නමුණුකුළ බලගනු

විනෝදකාමීන් තෙහෙට්ටුව නොබලා තරණය කරනු දැකිය හැකි වුවද, නමුණුකුළ කඳුවැටිය පිළිබඳව බොහෝවිට ප්‍රදේශයේ වැඩිහිටි ජනතාව තුළ පිළිසිඳ ඇත්තේ, යම් ආකාරයක භක්තියක් දෙන ආකාරයේ ගුප්ත විශ්වාසයන් යැයි කිවහොත් නිවැරදි ය.





ස්ථානයක් නැතහොත් දෙවියන්ගේ කන්ද ලෙස ද පූජනීයත්වයට පත්වී තිබේ.

දෙවියන්ගේ කන්ද යන අරුත දෙන ද්‍රවිඩ භාෂාවෙන් සාමිමලේ යනුවෙන් බහුතරයක් ඌවේ ජනතාව විසින් හඳුන්වනු ලබන නමුණුකුල මුළුමණින්ම තේ වතු, පතන හා වනයෙන් වැසී පවතී. කොටුගහතැන්න, බණ්ඩිය කන්ද, ලූනු බිස්ස වැනි කඳු මුදුන් නැමුණු ස්වභාවයක් පෙන්වන නිසාත් නමුණුකුල වශයෙන් ව්‍යවහාරයට පැමිණෙන්නට ඇතැයි පැවසේ. නමුණුකුල කඳුවැටියට සමාන්තරව ලුනුගල කඳුවැටිය පිහිටා තිබේ. දකුණින් ඇල්ල කපොල්ලත්, උතුරින් පස්සර කපොල්ලත් මගින් වෙන්ව ඇති නමුණුකුල වන රක්ෂිතය සමස්ත ඌව පළාතේ වර්ෂාපතන රටාවට දායක වනවා පමණක් නොව ඌවේ ජල පෝෂක ප්‍රදේශයක් වශයෙන් විශේෂයෙන් පහළ ඌව සරුසාර කරමින් ගලා බස්නා මැණික් ගඟ, කුඹුක්කන් ඔය හා බදුලු ඔය ද පෝෂණය කරයි.

නමුණුකුල තරණය කිරීම තරමක් වෙහෙස සහගත වුවද, කඳු පාමුල පිහිටි අඩි 1000 ක් පමණ යන තුරු පවතින පතන තලාව පීරාගෙන කඳුවැටිය තරණය කිරීම විනෝදජනකය. විශේෂයෙන් වැසි කාල වලදී දෝංකාරය නංවමින් ඇද හැලෙන පුංචි පුංචි සිසිල් ජල ධාරාවන් නමුණුකුල පරිසරය අලංකාර කරති. නමුණුකුල කඳු මුදුනට නැගගත් විට අවට දිස්වන පරිසරය ඉතා චමත්කාරජනක ය. ඈත කඳු මුදුන හා ඒ මත ද්‍රවටෙන මීදුම් කැරලි අමුතුම සුන්දරත්වයක් මවයි.

**නමුණුකුළ උස් බිම් සීමාවේ වනාන්තර තේ වගාව සඳහා එළිපෙහෙළි කිරීමත්, ජාවාරම්කරුවන්ගේ හා අනවසර පදිංචිකරුවන්ගේ දැව සංහාරයත්, දඩයම්කරුවන්ගේ සත්ත්ව සංහාරයත්, දැනටමත් නමුණුකුළ සුන්දර පරිසරයේ විනාශයට දයක වී ඇත.**

දැඩි සුළඟ මැද කඳු සිරස මතට පිවිසෙන්නකුට එහි එක යායට පැතිරුණු මල් පඳුරු දකින කළ මල්වත්තක් සිහිගැන්වේ. පොලව මත විසිරී පවත්නා රචානා කැට එම මල් වත්ත වඩාත් ඔප්නංවනවා ඇත. අක්කර පහක් පමණ වන කඳු මුදුනේ නැන්තේ කුඩා පඳුරු අතරින් තැනින් තැන ඉහළට නැගුණු කීණ ගස් සමග සිව් දෙස දිස් වන චමත්කාර පරිසරය සුවිශේෂී බවක් පෙන්නුම් කරයි. නමුණුකුළ මත සිට සිව් දෙස නෙත් යොමන විට දැක බලාගත හැකි තවත් විශේෂාංගයක් වනුයේ කඳු ප්‍රපාත අතර ගොදුරු සොයා සැරිසරන රාජාලියන් සමූහයකි.

නමුණුකුල වන රක්ෂිතය තුළ ශාක විශේෂ රැසක් හමු වේ. මෙහි කීණ, දඹ, බදුල්ල, සපු, අශෝක, සූරියමාර යන ශාක විශේෂ බහුලව දැකගත හැකි අතර. සවුක්කු, රෙඩ්ගම් යන ශාක සමග විවිධ වර්ගයේ කුරු ගස් හා බට පඳුරු ගාල් ද දක්නට ලැබේ. නමුණුකුළ කඳුවැටිය අලංකාර කරමින් වැවී ඇති මහරත්මල් ශ්‍රී ලංකාවට ආවේණික ශාකයකි. මීට අමතරව අඩි 5000 කට පමණ උස් බිමේ දක්නට ලැබෙන ශ්‍රී ලංකාවට ආවේණික දම්පාට බෝවිටියා මල් තවත් සුන්දර දසුනකි. නමුණුකුළ රක්ෂිතයේ සමස්ත ශාක ප්‍රජාව අතර කැපී පෙනෙන ප්‍රතිශතයක් හිමිකරගෙන ඇත්තේ ටූනා (Toona Ciliata) ශාකය යි. එම රක්ෂිතය තුළ ටූනා ශාක 20,000 කට අධික ප්‍රමාණයක් පැතිර ඇති බවට වාර්තා වේ.

මෙම වන රක්ෂිතය තුළ බහුල වශයෙන් වල් ඌරන් ගැවසෙන බවට වල් ඌරන් විසින් පොළොව හාරා ඇති ස්ථාන නිරීක්ෂණය කිරීමෙන් ද වටහා ගත හැකි ය.

මෙහි කුළු මීහරකුන් ද සුලභව ගැවසෙන හෙයින්, නමුණුකුළ තරණය කරද්දී වඩාත් සැලකිලිමත් වීම වඩාත් වැදගත් ය. එපමණක් නොව හාවුන්, මීමින්නන්, ඉත්තෑවන්, මුගටියන් හිවළුන් ආදී සතුන්ට ද වන රක්ෂිතය නිජබිම වී ඇත.

නමුණුකුළ කඳුවැටියේ පාමුල ස්ප්‍රිංවැලි ප්‍රදේශයේ පිහිටා ඇති බ්ලැක්පූල් නමින් වඩාත් ප්‍රකට කළුදිය පොකුණ ද අගනා ආකර්ෂණයකි.

ඌව පළාතේ සුවිශේෂී පරිසර පද්ධතියක් වන නමුණුකුළ වන රක්ෂිතයේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳව දැනටමත් ප්‍රශ්න මතු වී තිබේ. නමුණුකුළ උස් බිම් සීමාවේ වනාන්තර තේ වගාව සඳහා එළිපෙහෙළි කිරීමත්, ජාවාරම්කරුවන්ගේ හා අනවසර පදිංචිකරුවන්ගේ දැව සංහාරයත්, දඩයම්කරුවන්ගේ සත්ත්ව සංහාරයත්. දැනටමත් නමුණුකුළ සුන්දර පරිසරයේ විනාශයට දායක වී ඇත.

මීට අමතරව, නමුණුකුළ වන රක්ෂිතයේ බහුතරයක් ලෙස සැලකෙන ටූනා ශාක දිලීර රෝගයකින් විනාශවීමේ තර්ජනයකට මුහුණදී හමාර ය. කෙසේ හෝ වේවා, ඌව පළාතේ පාරිසරික තුල්‍යතාව උදෙසා අතිශයින් වැදගත් නමුණුකුළ වන රක්ෂිතය අනාගත පරපුර වෙනුවෙන් රැක ගැනීම සඳහා රජය ඇතුළු බලධාරී ආයතන සමග පරිසර හිතකාමී ජනතාව ද දැන්ම පෙරමුණ නොගතහොත් සුන්දර නමුණුකුළ ජාතියට අහිමි වීමේ කාලය වැඩි දුරක නොවන බව ද සඳහන් කළ යුතු ය. ❑